# මී මැසි පැටව්යි සමනල පැටව්ලයි



ඩබ්ලිව්.ඒ. සෙහංසා තේනුලි හේරත් වික්‍රමආරච්චි

# මී මැසි පැටවියි
# සමනල
# පැටවිලයි

ඩබ්ලිව්.ඒ. සෙහංසා තේනුලි හේරත් වික්‍රමආරච්චි

**මී මැසි පැංචියි සමනල පැංචිලයි**

කර්තෘ ප්‍රකාශනයකි

පළවන මුද්‍රණය 2023 ඔක්තෝබර් 15

කතාව සහ චිත්‍ර

**ඩබ්ලිව්.ඒ. සෙහංසා තේනුලි හේරත් වික්‍රමආරච්චි**

2 ශ්‍රේණිය B

මහාමායා බාලිකා විදුහල

ISBN 978-624-206-703-2

# පිදුම

ආදරණීය

අම්මාට, අප්පච්චිට, අක්කිට

ආදරණීය

ගයානි ගුරු මෑණියන්ට

ආදරයෙන්.....

ඩබ්ලිව්.ඒ. සෙහංසා වික්‍රමආරච්චි

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.


මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම් මහතාගේ සේවය ද අගයමි.


ශෂිකලා සේනාධීර,
විදුහල්පතිනිය.
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.
2023 .10 . 20



ඉර පායලා තිබුණ ලස්සන දවසක සමනල පැංචිලා ගමනක් යන්න පිටත් වුණා.



අතර මගදී එයාලට මී මැසි
පැංචියක් මුණ ගැහුනා.
"සමනල යාළුවනේ ඔයාලා
කොහේද යන්නේ. මාත් එන්නද
ඔයාලා එක්ක යන්න" මී මැසි
පැංචි ඇසුවා.



"ඔයාට මොකද අපි කොහේ ගියත්. ඔයාට බැහැ අපිත් එක්ක යන්න. ඔයා අපිට වඩා වෙනස්. ඉතින් ඔයා කොහොමද අපිත් එක්ක යන්නේ"

කහ පැංචි කීවා.

මී මැසි පැංචිට හොඳටම දුක හිතුනා. එයා අඬන්න පටන් ගත්තා.






“එපා යාළුවනේ එහෙම
කියන්න. අපි මී මැසි පැංචිටත්
කතා කරමු. අපි සිරිපාදේ
යනවා. ඔයත් එන්න අපිත්
එක්ක යන්න”
රෝස සමනලී කීවා.
ඔන්න කට්ටිය ගමන පිටත්
වුණා.



ගමන අතර මගදී තද හුළඟක්
හැමුවා. ගස් කොළන්
සෙලවෙන්න පටන් ගත්තා.
සමනල පැංචිලා කලබල වුණා.



“බය වෙන්න එපා අපි යමු අර
ගස් බෙනය යටට.”
මී මැසි පැංචි කීවා.
ගස් බෙනය ඇතුලට ගිය
යාළුවෝ කට්ටිය සුළඟින්
බේරුණා.



"අනේ මට සමාවෙන්න
මී මැසි පැංචි. ඔයාට එන්න
එපා කීවට. ඔයා නිසා අපි
බේරුණා".
කහ පැංචි කීවා.



"අපි හැමෝම එකමුතුව
සතුටින් ඉන්න ඕන."
රෝස සමනලී කීවා.



සමනල් යාළුවෝ මී මැසි පැංචිත් එක්ක සතුටින් සිරිපාදේ වඳින්න යන්න පිටත් වුණා.

හැමෝටම හරිම සතුටුයි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථීක පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දූරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකූර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ
2023.10.20